Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

සතිය- තුන් වන සතිය

ශ්‍රේණිය - 9 ශ්‍රේණිය

සැකසුම - නිලන්ත කෝනාර - ර/ගලතුර ම.වි.

- *මේ කාලය තුළ සෑම විෂයක්ම පුණරීක්ෂණයේ යෙදෙමින් අධ්‍යාපන කටයුතු වල නිරතවීම ඔබගේ වගකීමකි.*
- *මෙම කාර්යය සඳහා ඔබට සතියක කාලයක් ලැබේ.*
- විද්‍යුත් පැතුරුම්පත් පාඩමේ පිටු අංක 22 සිට 28 දක්වා අධ්‍යනය කරමින් පහත ක්‍රියාකාරකමෙහි නිරත වන්න.
- *ඔබේ පිළිතුරු හෝ නිර්මාණ **<u>තුන්වන සතිය-ICT- ඔබේ නම හා ශ්‍රේණිය</u>** ලියන ලද අමුණන ලද ගොනුවක් සේ සකස්කරන්න.*

සමන් පෙරේරා, සහල් ව්‍යාපාරිකයෙකි.ඔහුගේ ව්‍යාපාරයේ 2021 ජනවාරි මාසයේ ආදායම් හා වියදම් පහත පරිදි සිදුවී ඇත.ඔහුගේ සියළුම ගිණුම් තැබීම් ගිණුම් පොත්වල ලිඛිතව පමණක් සිදු කරයි.

| වියදම් | ආදායම් |
|---|---|
| 01/01 දින සම්බා සහල් 1000kg සඳහා රු.120000 යි<br>නාඩු සහල් 1000kg සඳහා රු. 100000 යි<br>01/06 සම්බා සහල් 1000kg සඳහා රු. 120000 යි<br>01/15 නාඩු සහල් 500kg සඳහා රු. 50000 යි<br>01/25 සිය සේවකයාට වැටුප් සඳහා රු 20000 යි<br>01/26 මාසික විදුලි වියදම ගෙවීම රු 2000 කි<br>01/30 කඩ කුලිය ගෙවීම රු 2500 යි | 01/05 සම්බා සහල් 350kg ක් රු. 52500 කට විකිණීය<br>01/06 නාඩු සහල් 800kg ක් රු. 88000 කට විකිණීය<br>01/10 සම්බා සහල් 500kg ක් රු 75000 කට විකිණීය<br>01/20 නාඩු සහල් 700kg ක් රු 77000 කට විකිණීය<br>01//27 සම්බා සහල් 1100kg ක් රු 165000 කට විකිණීය |

මාසය අවසානයේදී කරන ලද පරීක්ෂාවේදී පහත කරුණ අනාවරණය විය.
ජනවාරි මස 08 වන දින සම්බා 50kgක් විකුණා ඇතත් එය ගිණුම් ගත වී නොමැත. ආදායම රු 7500 කි.

1. ඉහත ගණුදෙනු ලිඛිතව සටහන් කර ලිඛිතව ගිණුම් තැබීම නිසා සමන් පෙරේරා හට මුහුණ පෑමට සිදුවන අපහසුතා 05ක් සඳහන් කරන්න.
2. ඉහත ගණුදෙනු විද්‍යුත් පැතුරුම් පතක සටහන් කලේ නම් ඉන් ඔහුට අත්වන වාසි 05ක් සඳහන් කරන්න.

(මේ සඳහා ඔබට වැඩිහිටියෙකුගේ උදව් ලබා ගත හැකිය)

➢ මෙම පාඩම අවසානයේදී විද්‍යුත් පැතුරුම් පතක් භාවිතා කර දත්ත විශ්ලේෂණය කිරීමේ හැකියාව ඔබට ලැබෙනු ඇත.එම දැනුම භාවිතා කර සමන් පෙරේරාගේ ව්‍යාපාරයේ ජනවාරි මාසයේ මුළු ආදායම, මුළු වියදම හා ලාභය ගණනය කරන්න.ඒ සඳහා පහත ආකාරයේ වගුවක් භාවිතා කල හැකිය.

ආදායම් වියදම් ප්‍රකාශය

| දිනය | ගණුදෙනු විස්තරය | ආදායම | වියදම | ලාභය |
|---|---|---|---|---|
| | | | | |
| 01/31 | මාසික ලාභය | | - | = |

- ○ සැලකිය යුතුයි : ආදායම - වියදම = ලාභය